ජගත් පේ එදිරිසිංහ ලියූ

ගිම්හාන සුළඟ

අවසාන කොටස

මේ අලුත් තත්වයට මුහුණ දෙන්නේ කෙසේ දැයි මට සිතා ගත නොහැකි ය. ජීවිතය යනු වැරදීම් සහ නිවැරදි කරගැනීම් පමණක්ම දැයි දැන් මට සිතෙයි. සිත සන්සුන් කරගන්නට මම වෙර දරමින් සිටින්නෙමි. පළමුව කළ යුතු දේ පළමුව කළ යුතු ය.

අශේන් සුසුම් හෙළන හඬ මට ඇසෙයි. ඒ සුසුමට රැවටෙන්නට දැන් මගේ දැඩි සිත මට ඉඩ නොදෙයි. අත්දැකීම් විසින් මා රළු කරනු ලැබ ඇත. අත්දැකීම් විසින් මා දරදඬුකොට ඇත. එය යහපතකි. මේ තාක් කාලයක් නොදැඟුණ නොතිබුණ ශක්තියක් දැන් මට දැනෙයි.

සුපුරුදු ලෙසම ඔහු සවස් වරුවේ නිවසින් පිටව ගියේ ය. මම කිසිවක් නොකීවෙමි. මේ ඔහුගේ අපචාර ගමනේ අවසාන දිනය විය යුතුය. එබැවින් මම ඉවසා සිටියෙමි.

රාත්‍රිය එළැඹෙත්ම මම කාමරයට වැදී දොරගුළු ලා ගත්තෙමි. නැවතත් මේ දොර ඔහු වෙනුවෙන් විවර නොකරන බවට මම මටම ශපථ කර ගත්තෙමි. විශාල බරකින් නිදහස ලැබුවාක් මෙන් සතුටක් මගේ සිතට දැනුණි. මම නිදහස ලැබුවෙමැයි යන සතුට විසින් මා සැහැල්ලුවට පත් කරනු ලැබ ඇත.

කිසිවකුට මගේ සිත විවර කළ යුතු ය. කියන්නේ කාට ද? ඇහුම්කන් දෙන්නේ කවු ද? විශ්ව... කලකට පෙර මගේ සියලු දක්ඛ දෝමනස්සයන්ට ඉවසිල්ලෙන් ඇහුම් කන් දුන් විශ්ව.. මගේ හිත හඳුන්නට වදනක් දෙවූ විශ්ව...

මම පරිගණකය ක්‍රියාත්මක කළෙමි. අන්තර්ජාලය හා සම්බන්ධ වූ වහාම මම විශ්ව ට ලිපියක් ලියන්නට පටන් ගත්තෙමි. සිදුවූ සියල්ල වචනයෙන් වචනය ගොණුකොට ලිවෙමි. ලියන අතරේ දී ඇසින් ගලා ගිය කඳුල පිසදාගන්නට වත් නොවෙහෙසී ලිවිවෙමි. මේ ලියමනේ ඇති අරුත කිමෙක්දැයි නොසිතා ම ලිවෙමි. දැන් ඇතැයි කියා සිතුණ මොහොතේ "SEND" බොත්තම ඔබා පරිගණක තිරය දෙස බලා සිටියෙමි. මේ මොහොතේ ඔහු පරිගණකය ඉදිරියේ සිටින්නේ නම් නිසැකවම මට පිළිතුරක් එවනු ඇත.

මා නිවැරදි ය. විනාඩි ගණනාවකට පසු ඔහුගෙන් පිළිතුරත් ලැබුණි. ලියා තිබුණේ එකම එක වචනයකි.

"ඉවසන්න.."

මම ඒ රාත්‍රිය සුවසේ නිදා ගත්තෙමි. අශේන් ආවේ කියවදැයි කියන්නට මම නොදත්තෙමි. ඔහු කියට ආවාද කෙසේ ආවාද කියා සොයන්නට දැන් මට අවශ්‍යතාවක් නැත.

මම උදෑසන නැගිට සාලයට එන විට ඔහු සාලයේ සෝපාව මත වැටී නිදා සිටියේ ය. ඔහුගේ මුහුණ පුරා ඇඳුන අප්‍රසන්න කාලකන්නි පෙනුම මගේ සිතේ ඇති කළේ අප්‍රලකි. මේ අප්‍රසන්න බව මට කළින් තේරුම් නොගියේ මන්දැයි මට නොවැටහෙයි. කුඩු කාරයෙක්... කුඩු කාරයෙක් ... මගේ සිත මොරගෑවේ ය. මම ඔහු නොදුටුවා සේ කුස්සියට ගොස් තේ එකක් සාදා ගත්තෙමි. ඔහු පිබිදෙන්නට ඇත්තේ මා තේ සාදන ශබ්දයට විය යුතු ය.

"මටත් තේ හැදුවද ?" ඔහු ඇසුවේ ය.
"නැහැ.." මම කීවෙමි.

"මටත් හදන්න ... ප්ලීස් .." එය ආයාචනයකි. මම කරබාගෙන තවත් තේ කෝප්පයක් සෑදුවෙමි. ඔහු සෝපාවෙන් නැගිට කුස්සියට පැමිණ මා අසළින්ම ගොස් තේ කෝප්පය අතට ගත්තේ ය. මම කාමරයට යන්නට හැරුණෙමි. ඔහු වහා මගේ වැළමිටෙන් අල්ලා ගත්තේ ය. මම අත ගසා දැමුවෙමි.

"පිස්සු නටන්න එපා..." මම කෝපයෙන් කීවෙමි.

"ඇයි.." ඔහු සිනාසෙන්නට වෙර දරයි. "එකම දේ නැවත නැවත කියන්න මට බැහැ... ඊයෙන් පස්සෙ අපි දෙන්නා අතරේ කිසිම ආකාරයක සම්බන්ධයක් නැහැ අශේන් ... ... ඒක තේරුම් ගන්න... අපි අතරේ කවමදාකවත් ආයේ සම්බන්ධයක් ඇතිවෙන්නෙත් නැහැ... මම තාමත් මෙතන ඉන්නෙ ඕයාට උදව් කිරීමේ අරමුණෙන් විතරයි.. ඒකත් අවශ්‍ය නැත්නම් කියන්න මම වෙන තැනක් හොයාගෙන යන්නම්..."

ඔහු කිසිවක් නොකියා ජනේලයෙන් ඈත බලාගෙන තේ කෝප්පය තොල ගෑවේ ය.

"මම ඩොක්ටර්ගෙන් අපොයින්ට්මන්ට් එකක් ගත්තා අශේන්... උදේ එකොළහට අපි යන්න ඕනෙ.. ලැස්ති වෙන්න..." මම කාමරයට යන අතර කීවෙමි.

කීකරු දරුවකු සේ ඔහු එකොළහ වන විට සූදානම්ව සිටියේ ය. කිසිදු ප්‍රශ්ණයක් නොනගාම මා සමගින් වෝචර්යා හමුවන්නට ආවේ ය.

"අශේන් ... මම එලියෙන් ඉන්නම්... ඔයාම ඇතුලට ගිහින් කතා කරන්න.." මා ඉදිරියේ වෝචර්යා හමුවීමෙන් ඔහු අපහසුතාවට පත් වේ යයි මම සිතුවෙමි. "....කිසිම දෙයක් හංගන්න එපා.. මේ ඔයාට ලැබෙන අවසාන අවස්ථාව වෙන්න පුළුවන්.. "

ඔහු කිසිවක් නොකියා මා දෙස බලා සිටියේ ය.

"යන්න.. හිතට ධෛර්යය ගන්න... "
"අපි ආපහු යමු.." ඔහු කීවේ ය.
"නැහැ අශේන්.. අපි ආපහු යන්නෙ නැහැ... යන්න ඇතුලට..
" මම දැඩිව කීවෙමි.

ඔහු ටික වේලාවක් මදෙස බලා සිටියේ ය . ඉන්පසු එකවරම වෝචර්යාගේ කාමරයට ඇතුල්වූයේ ය.

මම ඔහු පැමිණෙන තෙක් පිළිගැනීමේ කවුන්ටරය අසළින් වූ ආසනයක වාඩි වී සඟරාවක් පෙරළුවෙමි. ඔහු කාමරයෙන් ඉවතට ආවේ පැය බාගයකට පමණ පසුවය. දැඩි වෙහෙසවූ සෙයක් ඔහුගේ මුහුණේ සටහන්ව තිබුණි. ඔහු කීවේ කුමක්ද කියා හෝ වෝචර්යා කීවේ කුමක්ද කියා හෝ මම නොඇසුවෙමි.

මම නිහඬව ම රිය පැදවූයෙමි. ඔහු වින්ඩිස්ක්‍රීනයෙන් ඉදිරියේ පෙනෙන මාර්ගය දෙස හිස් බැල්මෙන් බලා සිටියේ ය.

"මාව රිහැබිලිටේෂන් ප්‍රෝග්‍රෑම් එකකට රිෆර් කළා..." ඔහු පහත් හඬින් කීවේ ය.

"ඒක හොඳයි.." මම කිවෙමි "..කවදද යන්න තියෙන්නෙ..?"
"හෙට.. " ඔහු කීවේ ය, ".. ඔයා එන්න අවශ්‍ය නැහැ.. මං තනියම යන්නං.."

මම නිහඬ වීමි. දැන් ඔහුගේ ජීවිතය ඔහුට බර දිය යුතුය. තව දුරටත් ඒ පිළිබඳ අවශ්‍ය ප්‍රමාණයට වඩා වෙහෙසෙන්නට අවශ්‍ය නැත.

එදින සවස් වරුවේ අශේන් නිවසෙන් පිටව ගියේ නැත. ඒ වෙනුවට ඔහු සෝපාව මත නින්දට වැටුණි. ඔහු නිදි පෙත්තක් බොන්නට ඇතැයි මම අනුමාන කළෙමි.

පසුදා සිට මම සුපුරුදු ලෙස විශ්ව විද්‍යාලයට යන්නට පටන් ගත්තෙමි. අශේන් ද සැම දිනෙකම උදෙන්ම පිටව ගියේ ය. අවසාන විභාගයට සූදානම් වෙමින් සිටි මට කරන්නට බොහෝ වැඩ කටයුතු තිබුණි.

10 පිටට